# වාර්ෂික වාර්තාව

# 2012

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

# පටුන


| | | පිටුඅංක |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 1 - 23 |
| 02. | 2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසාන ගිණුම් | 24 - 56 |
| 03. | 2012 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව | 57 - 62 |

<u>අන්තර්ගතය</u>


ආයතන පනත හා ලියාපදිංචිය

දැක්ම

මෙහෙවර

අරමුණු

<u>ආයතන කලමනාකාරීත්වය</u>
අධ්‍යක්ෂ මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

ආයතන ව්‍යුහය

මානව සම්පත්

මූල්‍ය කාර්ය සාධනය

සංවර්ධන ක්‍රියාකාරකම්

සේවා සැපයීම්

2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය
සඳහා වූ අවසාන ගිණුම්

2012 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

# ආයතන පනත හා ලියාපදිංචිය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද මේ වන විට සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය හස්ත කර්මාන්තකරුවා නව මාවතකට යොමු කරවීම තුලින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් සේවා සපයන රාජ්‍ය ආයතනයකි.

දැක්ම:

නිර්මාණ සංවර්ධනය හා නව නිර්මාණාත්මක මෝස්තර හදුන්වාදීම තුලින් හස්තකර්මාන්ත ක්ෂේත්‍රය වඩාත් සක්‍රිය ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

මෙහෙවර:

ප්‍රවර්ධනය, සංවර්ධනය, හැකියාවන් ගොඩනැංවීම, ප්‍රචලිත කිරීම සහ ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුලින් වෙළඳපොල පාදක කරගත් නිර්මාණාත්මක මෝස්තර හදුන්වාදීම.

අරමුණ:

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපල නැම්යාවන්ට අනුව නව නිර්මාණ හදුන්වා දීම.

- නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම සහ උසස් නිමාවකින් යුතු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන නිසි තාක්ෂණික ක්‍රම හා අමුද්‍රව්‍ය පිළියෙල කරගැනීමේ ක්‍රම හදුන්වා දීම.

- ආදයම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා පොදු පහසුකම් සේවාවන් ලබාදීම.

- හස්තකර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හදුන්වාදීම.

- ප්‍රකාශණ, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාල පහසුකම් සැපයීම මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට, අලෙවිකරුවන්ට සහ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින්නන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.

## සංවිධානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය,සමස්ත හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය අරමුණු ඉටු කරගැනීමට නිරතුරුව ක්‍රියාත්මක වී සිටි. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මැල් පාරේ අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පළාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය, නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්තකර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවී සිටි.

මීට අමතරව, ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර, ඒ හරහා නිර්මානශීලි හැකියාවක් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව ලබාදී ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුල ස්ථාපිත පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මඟින් හස්තකර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක  මෙහෙවර තුළින් තම අරමුණු ඉටු කිරීමේදී  ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීමත්, පවතින අනෙකුත් සහෝදර ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි සහයෝගයත් නිරතුරුව මෙම ආයතනයයේ කාර්යයන් ඉටුකිරීම සඳහා ඉවහල් වන අතර, මෙම ක්ෂේත්‍රයේ නියැලෙන ස්වේච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවෝ සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියළුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන මෙන්ම පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදී ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරිමට අදාල සියළුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මගින් සිදුකරන අතර පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියළු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මඟින් ද ඉටු කෙරේ.

| | | |
|---|---|---|
| (i) | ප්‍රධාන කාර්යාලය | අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව. |
| | දුරකථන/ෆැක්ස් අංක | 0112607114 සභාපති |
| | | 0112626345 අධ්‍යක්ෂ |
| | | 0112607814 පොදු |
| | ෆැක්ස් | 0112607111 |
| | ඊමේල් | slndcrisep@yahoo.com / info@slndc.gov.lk |
| (ii) | නත්තරම්පොත පොදු පහසුකම් මධ්‍යස්ථානය සහ වැඩහල | කලාපුරය, නත්තරම්පොත. |
| | දුරකථන අංකය / ෆැක්ස් | 0812420038 |

# ආයතන කළමනාකාරීත්වය

## (i) අධ්‍යක්ෂ මණ්ඩලය

ඩී.ඩබ්. මාෂල් ජනතා මහතා
සභාපති ජාතික මෝස්තර මධ්‍යස්ථානය

බුද්ධි කීර්තිසේන මහතා

එස්. ශ්‍රී චන්ද්‍රන් මහතා

අනෝමා ලෆීර් මහත්මිය

ෂෙරින් ෂේවියර් මෙනවිය

සුජාතා වීරකෝන් මහත්මිය

එන්. ගොඩකන්ද මහත්මිය

අනිල් කොස්වත්ත මහතා

වී. ජෙගරාජසිංහම් මහත්මිය

## (ii) ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

ඩී.ඩබ්. මාෂල් ජනතා මහතා
සභාපති ජාතික මෝස්තර මධ්‍යස්ථානය

එම්.ඒ.එස්.එස්.කේ. චන්ද්‍රසිරි මහතා
අධ්‍යක්ෂ ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ජේ.ඒ.ඒ.ආර්.සී. ගුණරත්න මහතා
කාර්මික සංවර්ධන ඉංජිනේරු

ඒ.ඒ. ගාමිණි මහතා
සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)

කේ.එම්.පී.එස්. අසිත කුසලධර්ම මහතා
සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
(2012/04/05 වැනි දින දක්වා)

පී.කේ. විජේසිංහ මහතා
සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත)

භද්‍රාණි රණවීර මහත්මිය
ගණකාධිකාරී

| බැංකුකරුවෝ | | විගණනය |
|---|---|---|
| ලංකා බැංකුව | කටුබැද්ද | රජයේ විගණකාධිපති |
| මහජන බැංකුව | කටුබැද්ද | විගණකාධිපති දෙපාර්තමේන්තුව |

# ආයතන ව්‍යුහය



සභාපති
අධ්‍යක්ෂ
නි.අ./ස.අ. (පරිපාලන)
නි.අ. (මෝස්තර සංවර්ධන)
නි.අ. (මෝස්තර, අධ්‍යාපන හා පුහුණු)
ගණකාධිකාරී
ස.අ. (මෝස්තර සංවර්ධන)
ස.අ.පර්යේෂණ (රසායනික)
ස.අ.පර්යේෂණ (අලෙවි)
ස.අ.පර්යේෂණ (යාන්ත්‍රික)
පරිපාලන නිලධාරී
ගිණුම් නිලධාරී
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
අභ්‍යන්තර විගණන නිලධාරී
මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
පුස්තකාල/තොරතුරු සහකාර
පෞද්ගලික සහකාර
පෞද්ගලික සහකාර
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
ශිල්ප උපදේශක
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
රියදුරු
කාර්යාල සහායක / මුරකරු

# මානව සම්පත්

## උපදේශකත්වය හා සමස්ත අධීක්ෂණය

| සභාපති | | |
|---|---|---|
| **තනතුර** | අනුමත | පවතින |
| අධ්‍යක්‍ෂ | 01 | 01 |

### මෙහෙයවීම

| **තනතුර** | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්‍ෂ | 02 | | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්‍ෂ/ සහකාර අධ්‍යක්‍ෂ(පාලන) | 01 | | 01 |
| සහකාර අධ්‍යක්‍ෂ පර්යේෂණ(යාන්ත්‍රික) | 01 | | 01 |
| සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) | 01 | | 01 |
| සහකාරඅධ්‍යක්‍ෂ පර්යේෂණ(අලෙවි) | 01 | | 01 |
| සහකාර අධ්‍යක්‍ෂ පර්යේෂණ(රසායනික) | 01 | | 01 |

### සංවර්ධන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධවන්නන්

| **තනතුර** | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨමෝස්තර සම්පාදක | 04 | 05 | |
| මෝස්තර සම්පාදක | 09 | 08 | 01 |
| අලෙවි සහකාර | 01 | 01 | |
| ශිල්ප උපදේශක | 32 | 15 | 17 |
| පුහුණු සහායක | | 03 | |

### සංවර්ධන ක්‍රියාවලියට වක්‍රව සම්බන්ධවන්නන්

| **තනතුර** | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| කාර්මික සංවර්ධන ඉංජිනේරු | | 01 | |
| සහකාර අධ්‍යක්‍ෂ | | 02 | |
| ගණකාධිකාරී | 01 | 01 | |
| පරිපාලන නිලධාරී | 01 | 01 | |
| අභ්‍යන්තර විගණක | 01 | | 01 |
| ගිණුම් නිලධාරී | 01 | | 01 |
| වැඩසටහන් සම්බන්ධිකරණ නිලධාරී | 01 | | 01 |
| සංවර්ධන සහකාර | 03 | 03 | |
| පුස්තකාල/තොරතුරු සහකාර | 01 | | 01 |
| පෞද්ගලික සහකාර | 02 | 02 | |
| කළමණාකරන සහකාර | 10 | 13 | |

| **තනතුර** | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| රියදුරු | 06 | 04 | 02 |
| කාර්යාල සහායක | 17 | 08 | 09 |
| මුරකරු | 04 | 07 | |

# <u>සංවිධාන ධූරාවලිය</u>



# <u>මූල්‍ය කාර්ය සාධනය</u>

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, මූලික වශයෙන් සේවා සපයන ආයතනයකි. එය රාජ්‍ය ව්‍යවස්ථාපිත සංස්ථාවක් වශයෙන් කටයුතු කරන අතර, අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් සපයනු ලැබේ.

2012 වර්ෂයට අදාළ අනුමත අයවැය සහ භාණ්ඩාගාරය ලබාදුන් ප්‍රතිපාදන පිළිබඳ දත්ත පහත දැක්වේ.







භාණ්ඩාගාරය විසින් ලබාදුන් ප්‍රතිපාදන වලට අමතරව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබන සේවා, විශේෂයෙන් උපදේශන සේවා සඳහා අයකරන ගාස්තු, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහයෙන් සිදුකරනු ලබන නව නිර්මාණ සංවර්ධන හා පුහුණු වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන හා පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අයකරනු ලබන ගාස්තු මඟින් ද අරමුදලට මුදල් ලැබේ. ඒ අනුව ජාතික මෝස්තර මධ්‍යස්ථානය පහත සඳහන් අරමුදල් පවත්වාගෙන යනු ලැබේ.

| | | |
|---|---|---|
| (1) | ජාතික මෝස්තර මධ්‍යස්ථාන අරමුදල | (NDC) |
| (2) | සේවක ණය අරමුදල | (SLC) |
| (3) | මෝස්තර උපදේශක සේවා අරමුදල | (DCF) |
| (4) | අලෙවි පර්යේෂණ අරමුදල | (TMF) |
| (5) | මෝස්තර අධ්‍යාපන හා පුහුණු අරමුදල | (DET) |

# <u>සංවර්ධන ක්‍රියාකාරකම්</u>

## 01. නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය භාරය අතර ප්‍රමුඛ කාර්යය ලෙස හැඳින්විය හැකි නව නිර්මාණ සැලසුම් කිරීම හා සංවර්ධනය හරහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපල කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන, ඉල්ලුමක් ජනිත කළ හැකි නව මෝස්තර නිර්මාණය කර, එම නිර්මාණ හස්තකර්මාන්ත ශිල්පියාට හඳුන්වාදී ඒ හරහා ඔවුන්ව ආර්ථිකමය වශයෙන් නඟා සිටුවීමට ක්‍රියා කරනු ලැබේ.

දේශීය අමුද්‍රව්‍ය සඳහා වටිනාකම් එකතුවීමේ ප්‍රතිශතය ඉහල නැංවීමට නව නිර්මාණ සංවර්ධනය බෙහෙවින් ඉවහල් වේ. එබැවින් සාම්ප්‍රදායික නිෂ්පාදන වලින් ඔබ්බට යමින් නව වෙළඳපලකට ප්‍රවේශ වීමට හස්තකර්මාන්ත ශිල්පියාට නිරතුරුව මඟපෙන්වන්නෙක් ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි.

මෙහිදී හස්තකර්මාන්ත ක්ෂේත්‍රය තුල අන්තර්ගත සියළුම ක්ෂේත්‍ර සඳහා නව මෝස්තර නිර්මාණය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානය හරහා සිදු කෙරෙන අතර ඒ අතුරින් පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව, ලාක්ෂා, පිත්තල, සම් හා ආභරණ යන ක්ෂේත්‍ර ප්‍රධාන තැනක් ගනී.

පවතින නිර්මාණයක් අද වෙළඳපලට හෝ සමාජයට ගැලපෙන ආකාරයට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම, නිර්මාණකරුගේ මනසේ ඇඳෙන නව සංකල්පයන් සම්මත පිරිවිතරන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉදිරිපත් කිරීම මෙන්ම ආයතනයෙන් සේවා අපේක්ෂා කරන්නන්ගේ ඉල්ලීම් මත ඔවුන්ගේ අවශ්‍යතාවයට අනුව නව මෝස්තර නිර්මාණය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානය හරහා සිදු කෙරේ. මීට අමතරව, රජයේ වැඩි අවධානයට ලක්වී ඇති සමරු හා ත්‍යාග භාණ්ඩ වෙනුවෙන් හස්තකර්මාන්ත ක්ෂේත්‍රය හරහා නව නිර්මාණ එළිදැක්වීම කෙරෙහි ජාතික මෝස්තර මධ්‍යස්ථානය වගකීමට බැඳී සිටී.

ඉහත අරමුණු ඉටු කරමින් දේශීය මෙන්ම විදේශීය වෙළඳපල ඉලක්ක කර නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදෙන හස්ත කර්මාන්තකරුවන්ට හා කුඩා කර්මාන්තකරුවන් සඳහා කාලීන වෙළඳපලට ගැලපෙන, පාරිභෝගික අවශ්‍යතා ඉලක්ක කරගනිමින් නව මෝස්තර සැලසුම් කිරීම හා සංවර්ධනය 2012 වසර තුල පහත ආකාරයට සපුරා ඇත.



## 2. නව නිර්මාණ මූලාද්ර්ශ බවට පරිවර්තනය කිරීම.

නව නිර්මාණ සංකල්ප වලින් තෝරාගත් නිර්මාණ, මොරටුව සහ නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුල පිහිටි වැඩහල් මඟින් මූලාද්ර්ශ ලෙස සංවර්ධනය කිරීම සිදු කෙරෙන අතර වැඩහල තුල නිෂ්පාදනය කළ නොහැකි නිර්මාණ පිටත ශිල්පීන් මඟින් නිෂ්පාදනය කර ගැනීමට කටයුතු කෙරේ. ඒ අනුව වාර්ෂික ඉලක්කය, වැඩහල තුල 338 ක් හා පිටත ශිල්පීන් මඟින් 25 ක් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙහිදී පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත නව නිර්මාණ 120 ක් නත්තරම්පොත වැඩහල තුලින් මූලාද්ර්ශ බවට පත් කෙරුණු අතර, පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව යන ක්ෂේත්‍ර මූලික කොට කරන ලද නිර්මාණ 230 ක් මොරටුව වැඩහල තුල මූලාද්ර්ශ බවට පත් කෙරුණි.

ඒ අනුව 2012 වර්ෂයේදී වැඩහල් තුල 352 ක් හා පිටත ශිල්පීන් මඟින් 28 ක් නව නිර්මාණ සංවර්ධනය කරමින් මුළු නව නිර්මාණ මූලාද්ර්ශ 380ක් හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට එළිදැක්වීමට හැකියාව ලැබුණි.

ව්‍යාපෘති හරහා ආයතනය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් හා පළාත්සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක ශිල්පීය පුහුණු වැඩසටහන් තුලදී මෙම මූලාද්ර්ශ ශිල්පියාට හඳුන්වා දී ඔවුන් එම නව නිර්මාණ නිෂ්පාදනයට යොමු කරවීමට ක්‍රියා කරන අතර, නව නිර්මාණ ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් මඟින් වැඩි ප්‍රමාණයක් ජාතික මෝස්තර මධ්‍යස්ථානයට සේවා ලබාගැනීම සඳහා පැමිණෙන ශිල්පීන් මඟින්, පළාත්සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක ශිල්පීය පුහුණු වැඩසටහන් මඟින්, නව නිර්මාණ ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් මඟින් සහ ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය හරහා වෙළඳපලට හඳුන්වාදීමට කටයුතු කර ඇත .






# හස්තකර්මාන්ත නව නිර්මාණ තුලින් සමරු නිර්මාණ එළිදැක්වීම

නිර්මාණ සංවර්ධනය හා නව නිර්මාණාත්මක මෝස්තර හදුන්වාදීම තුලින් හස්තකර්මාන්ත ක්ෂේත්‍රය වඩාත් සක්‍රිය ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීමයන දැක්ම හා මහින්ද චින්තන ඉදිරි දැක්ම යන ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත කෙෂ්ත්‍රය තුල සක්‍රිය ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කර ඇත.

දේශීය සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර සංවර්ධනයත් සමඟ මෙරටට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාත්මක වශයෙන් ඉහල යෑම, දේශීය හස්තකර්මාන්ත ශිල්පියාගේ ජීවන තත්ත්ව ඉහල නැංවීමට කෙසේ ඉවහල් වන්නේද යන්න පිලිබඳ අවධානය යොමු කිරීමේදී සමරු හා ත්‍යාග භාණ්ඩ නිෂ්පාදනය ප්‍රමුඛ වේ. එම නිසා ජාතික මෝස්තර මධයස්ථානය, දේශීය අනන්‍යතාවය පිළිඹිබු කෙරෙන සමරු හා ත්‍යාග භාණ්ඩ කෙරෙහි අවධානය යොමු කරමින් නව නිර්මාණ එළිදැක්වීමටත්, එම නිර්මාණ හස්තකර්මාන්ත ශිල්පියාට හදුන්වාදීමටත් ක්‍රියා කර ඇත. ඒ හරහා ඉලක්ක කළ සමරු හා ත්‍යාග භාණ්ඩ 22 ක් වෙනුවෙන් පාර්ලිමේන්තුව, අනුරාධපුරය, දළඳා මාළිගය, දේශීය අලියාගේ විවිධ ස්වරූපයන් වැනි දේශීය වටිනාකමක් ඇති දේ ඉලක්ක කරගනිමින් සමරු නිර්මාණයන් 23 ක් නිර්මාණය කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, නිරතුරුව වෙළඳපල අධීක්ෂණය කරමින් වෙලඳපලට ගැලපෙන මෙන්ම වෙළඳපල තුල ඉල්ලුමක් ඇති කළ හැකි නව නිර්මාණ බිහි කරමින් ඒවා හස්තකර්මාන්ත ශිල්පියා හරහා වෙළඳපලට ප්‍රවිෂ්ඨ කිරීමට කටයුතු කරයි.

මෙහිදී මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධන වැඩසටහන තුලින් හස්තකර්මාන්ත කෙෂ්ත්‍රයට ඉටුවිය යුතු මෙහෙවර පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම දිවි නැගුම සංවර්ධන වැඩසටහන, වැඩ කරන ජනතාවට ඒ තුලින් ඵලදායි මාවතක් විවර කරන්නට මූල්‍ය දායකත්වය ලබාදෙමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති දැවැන්ත සංවර්ධන වැඩසටහනකි, මීට අමතරව, හස්තකර්මාන්ත කෙෂ්ත්‍රයේ උන්නතිය වෙනුවෙන් ආරම්භ කෙරුණු සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන ද මෙම වර්ෂය තුල ආරම්භ කෙරුණු ඵලදායි ව්‍යාපෘතියකි.

මෙම සියළු සංවර්ධන වැඩසටහන් වලට දායකත්වය ලබාදෙමින්, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම හා උපදේශකත්වය යටතේ, විවිධ පළාත් ආවරණය කරමින් පහත සඳහන් ආකාරයට නව නිර්මාණ පිළිබඳ දැනුවත් කිරීමේ හා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට හැකියාව ලැබුණි.

| | |
|---|---|
| ඉලක්කය | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් 70<br>ප්‍රතිලාභීන් 2650 |
| සපුරා ගැනිම | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් 72<br>ප්‍රතිලාභීන් 2653 |

# 2012 වර්ෂය තුල පවත්වන ලද නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

| | **වැඩසටහනේ ස්වභාවය හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය** | **පවත්වන ලද ස්ථානය** | **ආරම්භක දිනට හා දින ගණන** | **සම්බන්ධීකරණ ආයතනය** | **ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | **හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව** | **වගකීම දැරූ නිලධාරියා** |
|---|---|---|---|---|---|---|---|
| 1 | මූලික පුහුණු වැඩසටහන කොහු ආශ්‍රිත | ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටුබැද්ද | ජනවාරි 24 දින 03 | | 12 | 6 | චන්න නදීජ පෙරේරා මයා මෝස්තර සංවර්ධන නිලධාරී |
| 2 | නව නිර්මාන පුහුණු වැඩසටහන සම් ආශ්‍රිත | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | පෙබරවාරි 16 දින 10 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | 13 | 4 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 3 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම දැව ආශ්‍රිත** | අනුරාධපුරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පෙබරවාරි 9 දින 02 | අනුරාධපුරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 20 | 13 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 4 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම දැව ආශ්‍රිත** | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පෙබරවාරි 09 දින 02 | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 11 | 19 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 5 | නව නිර්මාන පුහුණු වැඩසටහන රතුමැටි | රතුමැටි පුහුණු මධ්‍යස්ථානය අලව්ව වලකුඹුර කුරුණෑගල | පෙබරවාරි 20 දින 03 | කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව වයඹ පළාත | 30 | 12 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 6 | නව නිර්මාන පුහුණු වැඩසටහන තිරරෙදි | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | මාර්තු 05 දින 04 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | 19 | 8 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 7 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම දැව ආශ්‍රිත** | යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මාර්තු 03 දින 02 | යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 80 | 79 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 8 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම දැව ආශ්‍රිත** | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගම්පහ | මාර්තු 19 දින 02 | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 15 | 28 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 9 | නව නිර්මාන පුහුණු වැඩසටහන කොහු | ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටුබැද්ද | මාර්තු 14 දින 03 | | 11 | 5 | චන්න නදීජ පෙරේරා මයා මෝස්තර සංවර්ධන නිලධාරී |
| 10 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම පන් හා කෙඳි** | දැව පුහුණු මධ්‍යස්ථානය | මාර්තු 29 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 07 | 4 | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 11 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම රෙදිපිලි** | දැව පුහුණු මධ්‍යස්ථානය | මාර්තු 29 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 08 | 4 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 12 | නව නිර්මාන පුහුණු වැඩසටහන ආභරන | ශ්‍රී ලංකා පදනම් ආයතනය | මාර්තු 30 දින 01 | පොල් සංවර්ධන අධිකාරිය | 44 | | තුෂිනි විජේරත්න මිය මෝස්තර සංවර්ධන නිලධාරී |
| 13 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම දැව ආශ්‍රිත** | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අප්‍රේල් 23 දින 02 | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 7 | 12 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |

| | වැඩසටහනේ ස්වභාවය හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | පවත්වන ලද ස්ථානය | ආරම්භක දිනට හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|
| 14 | නව නිර්මාන පුහුණු වැඩසටහන උණ හාවේවැල් | විදුතා මාදම්පේ හලාවත | අප්‍රේල් 25 දින 03 | විදුතා මාදම්පේ හලාවත | 25 | 10 | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 15 | තාක්ෂණික පුහුණු වැඩසටහන කොහු ආශ්‍රිත | ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටුබැද්ද | මැයි 14 දින 03 | | 12 | 4 | චන්න නදීජ පෙරේරා මයා මෝස්තර සංවර්ධන නිලධාරී |
| 16 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව/ රෙදිපිළි | රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මැයි 23 ජුනි 13 දින 03 | රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 37 | | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 17 | නව නිර්මාන පුහුණු වැඩසටහන රතුමැටි | ගෝඨාභයපුර තිස්සමහාරාමය | මැයි 29 දින 01 | සංවර්ධන පදනම හම්බන්තොට | 80 | 4 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 18 | නව නිර්මාන පුහුණු වැඩසටහන රතුමැටි | පන්සලගොඩැල්ල බෙලිඅත්ත | මැයි 22 දින 01 | සංවර්ධන පදනම හම්බන්තොට | 61 | 4 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 19 | නව නිර්මාන පුහුණු වැඩසටහන පන් හා කෙඳි | බෙලිඅත්ත හම්බන්තොට | මැයි 22 දින | | 20 | 13 | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 20 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම දැව ආශ්‍රිත** | මහනුවර | මැයි 05 දින 02 | | 18 | 17 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 21 | නව නිර්මාන පුහුණු වැඩසටහන උණ හා වේවැල් | අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හම්බන්තොට | මැයි 29 දින 04 | අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 15 | 6 | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 22 | නව නිර්මාන පුහුණු වැඩසටහන දැව ආශ්‍රිත | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කෑගල්ල | ජුනි 13 දින 02 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කෑගල්ල | 20 | 14 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 23 | නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන රෙදිපිළි බතික් | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | ජුනි 06 දින 10 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | 15 | 10 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 24 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන පිත්තල | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | ජුනි 18 දින 02 | ශිල්ප සංවර්ධන සමිතිය කලාපුරය | 15 | | ටොරින් චන්ද්‍රසේකර මයා මෝස්තර සංවර්ධන නිලධාරී |
| 25 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව ආශ්‍රිත | මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ජුනි 26 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 37 | | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 26 | නව නිර්මාන පුහුණු වැඩසටහන පන් හා කෙඳි | බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගාල්ල | ජුනි 25 දින 05 | සංවර්ධන අධිකාරිය දකුණු පලාත | 20 | 10 | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |

| | වැඩසටහනේ ස්වභාවය හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | පවත්වන ලද ස්ථානය | ආරම්භක දිනට හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|
| 27 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිළි ආශ්‍රිත බෑග් | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | ජූනි 21 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 08 | 02 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 28 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිළි ආශ්‍රිත බතික් | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | ජූනි 29 දින 01 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 07 | 08 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 29 | නව නිර්මාණ හා නව තාක්ෂණය හදුන්වාදීමේ පුහුණු වැඩසටහන රතුමැටි | දංවැල්ල පුහුණු මධ්‍යස්ථානය කුරුණෑගල | ජූනි 27 දින 03 | කර්මාන්ත දෙපාර්තමේන්තුව වයඹ පළාත | 50 | 04 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 30 | නව නිර්මාන පුහුණු වැඩසටහන රතුමැටි | උදගම, මාවතගම කුරුණෑගල | ජූලි 24 දින 02 | වයඹ පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව | 26 | 6 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 31 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිළි | වැලිගම මාතර | ජූලි 04 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 20 | 1 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 32 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිලි බෑග් | අනුරාධපුරය | ජූලි 17 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 19 | 3 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 33 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිලි බෑග් | නත්තරම්පොත මහනුවර | ජූලි 30 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 17 | 4 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 34 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව ආශ්‍රිත | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 49 | 27 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 35 | නව නිර්මාන පුහුණු වැඩසටහන සම් ආශ්‍රිත | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ජූලි 23 දින 05 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | 10 | 6 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 36 | දැනුවත් කිරීමේ වැඩසටහන උණ හා වේවැල් | කුරුවිට රත්නපුර | ජූලි 09 | ජාතික ශිල්ප සභාව | 12 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 37 | දැනුවත් කිරීමේ වැඩසටහන **දිවිනැගුම** | මහනුවර | ජූලි | | 28 | | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 38 | නව නිර්මාන පුහුණු වැඩසටහන පන් හා කෙඳි ආශ්‍රිත | කිරින්දගම හම්බන්තොට | අගෝස්තු 13 දින 05 | | 10 | 10 | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 39 | දැනුවත් කිරීමේ වැඩසටහන උණ හා වේවැල් | අක්මීමන ගාල්ල | අගෝස්තු 17 | | 24 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |

| | වැඩසටහනේ ස්වභාවය හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | පවත්වන ලද ස්ථානය | ආරම්භක දිනට හා දින ගණන | සම්බන්ධිකරණ ආයතනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|
| 40 | නව නිර්මාන පුහුණු වැඩසටහන උණ හා වේවැල් | අයිවෙල මොනරාගල | අගෝස්තු 25 දින 03 | | 20 | 3 | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 41 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිළි බීරළු | සිජ්නාරා ගාල්ල | අගෝස්තු 23 දින 02 | | 22 | 4 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 42 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව ආශ්‍රිත | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සැප්තැම්බර් 07 දින 02 | බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 46 | 20 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 43 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව ආශ්‍රිත | මාතලේ | සැප්තැම්බර් 20 දින 02 | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 35 | 20 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 44 | නව නිර්මාන පුහුණු වැඩසටහන TOT රෙදිපිළි | අම්පාර කර්මාන්ත දෙපාර්තමේන්තුව | සැප්තැම්බර් 12 දින 02 | අම්පාර කර්මාන්ත දෙපාර්තමේන්තුව | 21 | 4 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 45 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිළි විසිතුරු නිර්මාණ | මැනික්හින්න මහනුවර | සැප්තැම්බර් 17 දින 05 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | 15 | 6 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 46 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙක්සින් බෑග් | කාර්මික සංවර්ධන මණ්ඩලය මධ්‍යම පළාත | දින 10 | කාර්මික සංවර්ධන මණ්ඩලය මධ්‍යම පළාත | 20 | | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 47 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | සැප්තැම්බර් 14 | ජාතික ශිල්ප සභාව | 7 | | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 48 | දැනුවත් කිරීමේ වැඩසටහන උණ ලී ආශ්‍රිත | මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | සැප්තැම්බර් 18 | මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය | 75 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 49 | දැනුවත් කිරීමේ වැඩසටහන උණ ලී හා කොහු ආශ්‍රිත | අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සැප්තැම්බර් 21 | අගුණකොළපැලැස්ස විද්‍යා | 66 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 50 | දැනුවත් කිරීමේ වැඩසටහන උණ ලී හා කොහු ආශ්‍රිත | ගාල්ල පෝද්දල | සැප්තැම්බර් 11 | ජාතික ශිල්ප සභාව | 91 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 51 | නව නිර්මාන හා තාක්‍ෂණික පුහුණු වැඩසටහන රෙදිපිළි බතික් | නත්තරම්පොත මහනුවර | ඔක්තෝම්බර් 16 දින 10 | අපනයන වාණිජ මණ්ඩලය | 20 | 6 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 52 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව ආශ්‍රිත | පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සැප්තැම්බර් 07 දින 02 | පොලොන්නරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 75 | 40 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |

| | වැඩසටහනේ ස්වභාවය හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | පවත්වන ලද ස්ථානය | ආරම්භක දිනට හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|
| 53 | වෘත්තීය පුහුණු උපදේශක වැඩසටහන දැව ආශ්‍රිත | සමාජ සේවා දෙපාර්තමේන්තුව වෘත්තීය පුහුණු අංශය සීදුව | ඔක්තෝම්බර් 31 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 7 | 21 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 54 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 08 | දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 55 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 55 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 15 | දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 81 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 56 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 16 | දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 60 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 57 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් | දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 342 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 58 | දැනුවත් කිරීමේ වැඩසටහන උණ හා වේවැල් | වේවැල්දෙණිය | ඔක්තෝම්බර් 17 | රදවඩුන්න වේවැල් ආශ්‍රිත සමුපකාර සමිතිය | 10 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 59 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 18 | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 65 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 60 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 22 | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 60 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 61 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 23 | මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 92 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 62 | දැනුවත් කිරීමේ වැඩසටහන හස්තකර්මාන්ත | මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඔක්තෝම්බර් 25 | මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 50 | | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 63 | නව නිර්මාන හා තාක්ෂණික පුහුණු වැඩසටහන පන් හා කෙඳි | නාලන්කුඩා මඩකලපුව | ඔක්තෝම්බර් 18 දින 04 | තල් සංවර්ධන මණ්ඩලය | 175 | 20 | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 64 | තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන පිත්තල වාත්තු | කිරිවවුල පිලිමතලාව | නොවැම්බර් 16 දින 04 | ශිල්ප සංවර්ධන සමිතිය කිරිවවුල | 15 | | ටොරින් චන්ද්‍රසේකර මයා මෝස්තර සංවර්ධන නිලධාරී |
| 65 | නව නිර්මාන පුහුණු වැඩසටහන රතුමැටි ආභරණ | කොරතොට කඩුවෙල | නොවැම්බර් 09 දින 03 | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය කොළඹ දිස්ත්‍රික්කය | 26 | | ටොරින් චන්ද්‍රසේකර මයා මෝස්තර සංවර්ධන නිලධාරී |

| | වැඩසටහනේ ස්වභාවය හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | පවත්වන ලද ස්ථානය | ආරම්භක දිනට හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|
| 66 | නව නිර්මාන හා තාක්ෂණික පුහුණු වැඩසටහන රතු මැටි | උඩුකිරිවිල මැටි පුහුණු මධ්‍යස්ථානය | නොවැම්බර් 07 දින 03 | කර්මාන්ත දෙපාර්තමේන්තුව දකුණු පළාත් සභාව | 20 | 6 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 67 | නව නිර්මාන හා තාක්ෂණික පුහුණු වැඩසටහන රෙදිපිළි බතික් | නත්තරම්පොත මහනුවර | දෙසැම්බර් 12 දින 05 | මධ්‍යම පළාත් වාණිජ මණ්ඩලය | 13 | 3 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |
| 68 | නව නිර්මාන හා තාක්ෂණික පුහුණු වැඩසටහන කොහු ආශ්‍රිත | ධීවර ප්‍රජා ශාලාව පොතුපිටිය වාද්දුව | දෙසැම්බර් 10 දින 03 | ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව කළුතර | 25 | 5 | චන්න නදීජ පෙරේරා මයා මෝස්තර සම්පාදක |
| 69 | නව නිර්මාන පුහුණු වැඩසටහන **දිවි නැගුම** දැව ආශ්‍රිත | මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දෙසැම්බර් 08 දින 02 | මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 25 | 22 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 70 | නව නිර්මාන පුහුණු වැඩසටහන රෙදිපිලී බීරළු රේන්ද | වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයමාතර | දෙසැම්බර් 13 | ආර්ථික සංවර්ධන මණ්ඩලය | 20 | 2 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 71 | නව නිර්මාන පුහුණු වැඩසටහන උණ ලී ආශ්‍රිත | අතුරලිය විද්‍යා මධ්‍යස්ථානය | දෙසැම්බර් 04 දින 05 | ජාතික ශිල්ප සභාව හා අතුරලිය විද්‍යා මධ්‍යස්ථානය | 18 | 8 | ඩබ්.එම්. පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 72 | නව නිර්මාන පුහුණු වැඩසටහන පන් හා කෙඳි ආශ්‍රිත | කඹුරුපිටිය මාතර | දෙසැම්බර් 04 දින 05 | ජාතික ශිල්ප සභාව | 25 | 5 | සෝමලතා ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |

## හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වා දීම

කාලීන වෙළඳපල අවශ්‍යතා ඉලක්ක කරගනිමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය, වෙලඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීමත්, ඒවායේ මූලික සාම්පල ආයතනයේ වැඩහල් තුල නිෂ්පාදනය කිරීමත් සිදු කරන අතර, එම නිර්මාණ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් හරහා මෙන්ම ආයතනයට පැමිණෙන ශිල්පීන්ගේ ඉල්ලීම මත හදුන්වාදෙනු ලැබේ. එමෙන්ම ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන ‘‘යුගයට නිමැවුම්’’ ප්‍රදර්ශණයේදී, ශිල්ප ජාතික ප්‍රදර්ශණයේදී හා වෙනත් සහභාගි වන ප්‍රදර්ශණ හරහා එම නිර්මාණ එළිදක්වනු ලැබේ. ඒ අනුව 2012 වර්ෂය තුල නව නිර්මාණ 450ක් හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට හදුන්වාදීමට ඉලක්ක කළ අතර 471 ක් සපුරා ගැනීමට හැකියාව ලැබුණි..

## <u>සංවර්ධන ව්‍යාපෘති හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ලබාදුන් දායකත්වය</u>

## “දිවි නැගුම” ජාතික සංවර්ධන වැඩසටහන

2011 වර්ෂයේ ආරම්භ කෙරුණු දිවි නැගුම ජාතික සංවර්ධන වැඩපිළිවෙලට එම වර්ෂයේ සිට සක්‍රිය දායකත්වයක් ලබාදෙමින් ක්‍රියාත්මක වූ ජාතික මෝස්තර මධ්‍යස්ථානය එම සංවර්ධන වැඩසටහන යටතේ පවත්වන ලද ප්‍රදර්ශණ සඳහා සහභාගිවීම, එහිදී රැස් කර ගත් දත්ත මත සේවා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූවන් සඳහා උපකරණ හා අමුද්‍රව්‍ය ලබාදීම යන කාර්යයන් ඉටු කරන ලදි.

ඒ අනුව, 2012 වර්ෂයේ දී මහනුවර, හම්බන්තොට, රත්නපුර, මඩකලපුව,පොලොන්නරුව, බදුල්ල, කිලිනොච්චි, මාතලේ, වවුනියාව, ගාල්ල, ත්‍රිකුණාමලය, මුලතිව් නුවරඑළිය, කළුතර යන දිස්ත්‍රික්කයන්හිදී පවත්වන ලද ප්‍රදර්ශණ 14 ක් සඳහා සහභාගි වී අප ආයතනයෙන් සේවා අපේක්ෂා කරන්නන් දැනුවත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ, ගම්පහ, යාපනය, මොනරාගල, අනුරාධපුරය, කෑගල්ල, රත්නපුරය, මන්නාරම, බදුල්ල, මහනුවර, හම්බන්තොට, මාතලේ, පොලොන්නරුව, පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි හස්තකර්මාන්ත ශිල්පීන් වෙනුවෙන් නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වර්ෂය තුලදී කොළඹ දිස්ත්‍රික්කයෙන් පුහුණු වැඩසටහන සඳහා සහභාගි වී නව නිර්මාණ හා තාක්ෂණික දැනුම ලබාගත් ශිල්පීන් සඳහා අමුද්‍රව්‍ය කට්ටල ලබා දිමට කටයුතු කරන ලදි.

## සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන

සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන කිරීම සඳහා මෙම වර්ෂය වෙනුවෙන් සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට වෙන් වූ මුදලින් රුපියල් මිලියන 5.7 ක් ජාතික මෝස්තර මධ්‍යස්ථානයට ලබාදුන් අතර,ඒ හරහා පහත හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහනට දායකත්වය ලබාදිමට හැකියාව ලැබුණි.

| | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගම්මානය |
|---|---|---|---|---|
| 01 | ලාක්ෂා | මාතලේ | රත්තොට | පහළහපුවිද |
| 02 | දැව | ගාල්ල | බෝපේ පෝද්දල | බෝපේ පෝද්දල |
| 03 | සංගීත භාණ්ඩ | මාතර | මාතර | හිත්තටිය |
| 04 | වෙස්මුණු | කළුතර | හොරණ | බණ්ඩාරවත්ත, මව්ගම (බටුවිට) |
| 05 | සේසත් | මාතලේ | යටවත්ත | උනවේරුව |
| 06 | ආභරණ | මහනුවර | පහලහේවාහැට | නීලවල |
| 07 | සංගීත භාණ්ඩ | මහනුවර | උඩුනුවර | කූරගල |

එම වැඩසටහන යටතේ ඉහත ගම්මාන 7 සඳහා නව නිර්මාණ සංවර්ධන හා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම තුලින් හස්තකර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන වෙළඳපල අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් සංවර්ධනය කිරීමත්, ඊට අදාල වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීම හා ශිල්පීන්ට අවශ්‍ය උපකරණ ලබාදීමේ කටයුතු සිදු කිරීමට නියමිත වේ.

මෙම වැඩසටහනට අදාල ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම වර්ෂයේ දී පහළහපුවිද, බෝපේ පෝද්දල, උනවේරුව, නීලවල යන ගම්මාන සඳහා නිරීක්ෂණ චාරිකාවන් සිදුකර ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය සියළු තොරතුරු රැස්කර ගැනීමත්, එම ශිල්පීන් දැනුවත් කිරීමත් සිදුකරන ලදි.

### <u>ජාතික මෝස්තර මධ්‍යස්ථානය, යූ.එන්.ඩී.පී. ආයතනය සමඟ එක්ව උතුරු පළාතේ හස්තකර්මාන්ත ශිල්පින් වෙනුවෙන් පවත්වන ලද නව නිර්මාණ සංවර්ධන හා වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීමේ වැඩසටහන</u>

පසුගිය 30 වසරක යුධමය ව්‍යසනයෙන් පීඩාවට පත් උතුරු පළාතේ හස්ත කර්මාන්ත ශිල්පීන් යලි නඟා සිටුවීම අරමුණු කරගනිමින්, යාපනය මුලතිව් හා කිලිනොච්චි යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තල්කොළ ආශ්‍රිත හස්තකර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනයේ යෙදෙන පුහුණුව ලැබූ හා ආධුනික තරුණ කාන්තා කණ්ඩායම් 06ක් තෝරාගනිමින් ඔවුනට දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවයන්ට ගැලපෙන නව නිර්මාණාත්මක භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ දැනුම ලබාදීමත්, තාක්ෂනික හැකියාවන් සංවර්ධනය කිරීමත්, වෙලඳපල සම්බන්ධතා ගොඩගැනීමත් පාදක කර ගනිමින් යූඑන්ඩීපී ආයතනයේ අරමුදල් රුපියල් මිලියන 5.4ක් හා සම්බන්ධිකරණය ඇතිව ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

2012.10.30 දින ආරම්භ කෙරුණු මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි දැක්විය හැකිය.
දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවයන්ට ගැලපෙන නව නිර්මාණ හා සරල තාක්ෂණය හඳුන්වා දීම තුලින් වෙළඳපල අවස්ථා උදා කරදීමත්, ඒ හරහා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහල නංවාලීම හා ජීවන තත්වය උසස් කිරීම
30 වසරක යුධමය ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවට තිරසාර ජීවනෝපාය මාර්ග ඇති කිරීම
මෙම පිරිස්, කණ්ඩායම් ක්‍රියාකාරිත්වයට යොමු කිරීම හරහා ආකල්පමය වෙනසක් ඇති කිරීමත්, ඒ ඔස්සේ සමාජ හා ආර්ථික තත්වයන් ඉහල නැංවීම

ඉහත අරමුණු හරහා ඉහත කණ්ඩායම් වෙත ලඟා කර දීමට අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිලාභ

- තිරසාර ජීවනෝපාය මාර්ග බිහිවීම
- නව නිර්මාණකරණය පිළිබඳ සංකල්ප කර්මාන්තයේ නිරත පිරිස් වලට සම්ප්‍රේෂණය වීම
- කණ්ඩායම් ක්‍රියාකාරිත්වය වර්ධනය වීම හරහා සමාජ තත්වයන් ඉහල යාම මෙම පිරිස් වල ආකල්පමය වෙනසක් සිදු වීම හරහා අනාගතය දෙස සුභවාදී දැක්මකින් කටයුතු කිරීමට පෙළඹීම
  මෙම ව්‍යාපෘතිය තුල යාපනය , මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වලතෝරා ගත් පහත සඳහන් නිෂ්පාදන කණ්ඩායම් පිළිබඳ මූලික තොරතුරු අධ්‍යනය කිරීම හා දත්ත රැස් කිරීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් 2012.11.06 සිට 2012.11. 10 දක්වා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලද අතර ඉදිරි ක්‍රියාකාරකම් 2013 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

## <u>යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශණය</u>

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අනන්‍යතාවය පිළිඹිබු කරමින් ශිල්ප 2012 ජාතික ප්‍රදර්ශණයට සමගාමීව ''යුගයට නිමැවුම්'' නව නිර්මාණ ප්‍රදර්ශණය හා අලෙවි පොළ2012.12.27 වන දින සිට 2012.12.30 දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු යෙදුණි. මෙම ප්‍රදර්ශණය සඳහා පන් හා කෙඳි, රතු මැටි, කොහු, රෙදි පිලි, දැව, උණ හා වේවැල්, ලාක්ෂා, පිත්තල හා සම් ආශ්‍රිත ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංවර්ධන කරන ලද නව නිර්මාණ 500 ක් පමණ එළිදක්වන ලදි. එමෙන්ම මෙම ප්‍රදර්ශණය නැරඹීම සඳහා 4500 ක් පමණ පිරිසක් පැමිණි අතර, ඒ අතුරින් ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබා ගැනීමට අපේක්ෂිත පිරිස දැනුවත් කිරීම ද මෙම ප්‍රදර්ශණ කාලය තුල සිදුකරන ලදි.

මීට අමතරව, ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබා ගත් හස්තකර්මාන්ත ශිල්පීන් 12 දෙනෙකු සඳහා අලෙවිකුටි ලබාදෙමින් ඔවුන්ට අලෙවි කටයුතු සිදුකර ගැනිමට අවස්ථාව ලබාදුනි.

## <u>ජාතික මෝස්තර මධ්‍යස්ථානය හරහා උපදේශන සේවා</u>

### මෝස්තර උපදේශක සේවා සම්බන්ධීකරණය

| සේවාව සඳහා ඉල්ලීම් කරන ලද ආයතනය | කාර්යය |
|---|---|
| විගණන දෙපාර්තමේන්තුව | සම්මාන නිර්මාණය |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | බීජ පැළ බහාලුම් නිෂ්පාදනය ප්‍රදර්ශණාත්මක කුකුල් කූඩු ආකෘතීන් |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | දේශනේත්‍ර සම්මාන නිෂ්පාදනය |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | අභ්‍යන්තර අලංකරණ කටයුතු |
| පාර්ලිමේන්තු වේත්‍රධාරී කාර්යාලය | කථානායකතුමාගේ නිල රථය සඳහා සෙංකෝලය හා එිය ඇතුලත් ධජය නිෂ්පාදනය කිරීම |

## අලෙවි හා තොරතුරු අංශයේ ක්‍රියාකාරකම්

### ශිල්ප 2012 ප්‍රදර්ශණය

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වාර්ෂිකව සංවිධානය කර අමාත්‍යංශය යටතේ පවත්නා ආයතන වල සහභාගිත්වය ඇතිව පවත්වන උක්ත ප්‍රදර්ශණය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දයකත්වය ලබාදුන් අතර එම ප්‍රදර්ශණයට සමගාමීව ජාතික මෝස්තර මධ්‍යස්ථානය පවත්වන යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශය පවත්වන ලදි.

ඊට අමතරව, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ පිරිනිර්මාණ විද්‍යාලයේ සිසුන්ගේ ව්‍යාපෘති වලට අදල නව නිර්මාණ ශිල්ප ප්‍රදර්ශණය තුල එළිදැක්වීමට කටයුතු කරන ලදි.

### අලෙවි පර්යේෂණ වැඩසටහන

සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ බෝපේ පෝද්දල දැව ආශ්‍රිත හා පහළහපුවිද ලාක්ෂා යන හස්තකර්මාන්ත ගම්මාන වල ශිල්පීන්ට වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ හදුන්වාදීම අරමුණු කරගෙන කොළඹ ආශ්‍රිත හස්තකර්මාන්ත අලෙවිසැල් කිහිපයක් යොදගනිමින් අලෙවි පර්යේෂණ වැඩසටහන් 02 ක් මෙම වර්ෂය තුල පවත්වන ලදි.

### අලෙවි ප්‍රවර්ධන වැඩසටහන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, මෙම වර්ෂය තුල නිර්මාණය කරන ලද නව නිර්මාණ එකතුවක් ඇතුලත් නව නිර්මාණ නාමාවලියක් මුද්‍රණය කර, යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශණය නැරඹීමට පැමිණි ගැණුම්කරුවන්, ජාත්‍යන්තර වෙළඳපල සම්බන්ධතා ඇති පුද්ගලයින් 250 දෙනෙකු වෙත ලබාදෙන ලදි.

### පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම

කටුබැද්ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙන්ම නත්තරම්පොත ශාඛා කාර්යාලයේ පිහිටි පුස්තකාල හරහා හස්තකර්මාන්ත ශිල්පීන් හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් 261 දෙනෙකු සඳහා පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීමත් සිදු කරන ලද අතර, පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාවද මේ හරහා සිදුකිරීමට කටයුතු කෙරුණි.

## පිරිනිර්මාණ අධ්‍යාපන හා පුහුණු කටයුතු

### ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය මඟින් පිරිනිර්මාණකරනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් සංවිධානය කරනු ලබන අතර, එමගින් පිරිනිර්මාණකරනය පිළිබඳ අධ්‍යනය කිරීමට උනන්දුවක් දක්වන තරුණ කණ්ඩායම් සඳහා අධ්‍යාපන අවස්ථා නිර්මාණය කොට ඇත.
මෙම ක්ෂේත්‍රය තුල රැකියාවල නිරත වීමට අපේක්ෂා කරන පාර්ශවයන්ට මෙන්ම දැනට මෙම ක්ෂේත්‍රයේ රැකියා වල නිරත පාර්ශවයන්ට ඔවුන්ගේ දැනුම පුළුල් කර ගැනීමට මෙම පාඨමාලාවන් මහගු පිටුවහලක් වේ. මෙම පාඨමාලා හරහා න්‍යායික මෙන්ම ප්‍රායෝගික දැනුම ඔවුන්ට ලබා ගැනිමට අවස්ථාව ඇත.
දේශීය වශයෙන් දක්ෂතාවයන්ගෙන් පරිපූර්ණ, වෘත්තීය මට්ටමේ නිර්මාණකරුවන්ගේ පවතින හිඟය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා සඳහා යොමුවීමට මනා සුදුසුම්වලින් යුත්, තරුණ නිර්මාණකරුවන් බිහි කිරීමේ කාර්යය මෙම ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය විසින් සිදු කරනු ලබයි.

මේ වන විට සතියේ දිනයන්හිදී මෙන්ම සති අන්ත වශයෙන් පාඨමාලා සඳහා සිසුන්ට සහභාගි වීමට හැකි වන පරිදි පහත සඳහන් පාඨමාලා ක්‍රියාත්මක කෙරේ.

පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2010   2012) (සතියේ දිනවල) උක්ත පාඨමාලාව සඳහා සිසුන් 10 දෙනෙකු සම්බන්ධ විය

පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2011   2013)  (සතියේ දිනවල) මෙම පාඨමාලාව සඳහා  සිසුන් 10 දෙනෙකු සම්බන්ධ විය

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ  ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2011   2013) (සති අන්ත) මෙම පාඨමාලාව සඳහා  සිසුන් 05 දෙනෙකු සම්බන්ධ විය.

## ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාගත් ප්‍රතිලාභීන්

| සේවාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| නව නිර්මාණ දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් තුලින් සේවා ලබාගත් හස්තකර්මාන්ත  ශිල්පීන් | 2653 |
| ඇනවුම් හා අලෙවි අවස්ථා ලබාගත් ප්‍රතිලාභීන් | 12 |
| වෙළඳපල,ශිල්පීන්, ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාගත් ප්‍රතිලාභීන් | 95 |
| ආයතනයේ වැඩහල තුල ප්‍රායෝගික පුහුණුව ලැබූ ප්‍රතිලාභීන් | 57 |
| පොදු පහසුකම් ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 62 |
| ආයතනයට පැමිණ/ ඉල්ලීම් මත මෝස්තර ලබාදීම (ග්‍රැෆික් නිර්මාණ ඇතුළුව) | 71 |
| පුස්තකාල සේවා ලබාගත් ප්‍රතිලාභීන් | 261 |
| පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා සේවාවන් ලබාදීම(ව්‍යාපෘති වාර්තා සකස් කිරීම ආදිය සඳහා | 61 |
| ආයතනයට පැමිණ දැනුවත් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව (පාසල් සිසුන් ) හා ආරාධනා මත විවිධ ආයතන තුල සිදුකරන දැනුවත් කිරීම් | 1224 |
| අලෙවි ප්‍රවර්ධනය හරහා ප්‍රතිලාභ ලබාගත් සංඛ්‍යාව | 250 |
| අලෙවි පර්යේෂණ වැඩසටහන්  හරහා ප්‍රතිලාභ ලබාගත් සංඛ්‍යාව | 150 |
| මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 4896 |

| ජාතික මෝස්තර මධ්‍යස්ථානය<br>භෞතික ප්‍රගතිය 2012 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය/වැඩසටහන/ක්‍රියාකාරකම් | භෞතිකප්‍රගතිය | |
| | | ඉලක්කය | සපුරා ගැනීම |
| 1 | නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය | | |
| 1.1 | සැලසුම් කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව | 672 | 680 |
| 1.2 | සංවර්ධනය කරන ලද නව සාම්පල සංඛ්‍යාව | 363 | 380 |
| 1.2.1 | මොරටුව වැඩහලේ නිමකරන ලද මූලික සාම්පල් සංඛ්‍යාව | | 230 |
| 1.2.2 | නත්තරම්පොත වැඩහලේ නිමකරන ලද මූලික සාම්පල් සංඛ්‍යාව | | 122 |
| 1.3 | ආයතනයේ අවශ්‍යතාවය මත පිටත ශිල්පීන් මගින් නිෂ්පාදනය කරගත් නිර්මාණ සංඛ්‍යාව | | 28 |
| 2 | නව නිර්මාණ දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් | | |
| 2.1 | නව නිර්මාණ දැනුවත් කිරීමේ වැඩසටහන් | 10 | 15 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1500 | 1118 |
| 2.2 | නව නිර්මාණ හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් | 50 | 55 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1000 | 1507 |
| 2.3 | ගුරු ශිල්පින් සඳහා නව නිර්මාණ හදුන්වාදීමේ වැඩසටහන් | 10 | 02 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 150 | 28 |
| 2.4 | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | 450 | 471 |
| 3 | නවක නිර්මාණකරුවන් හා හස්තකර්මාන්ත ශිල්පීන් සඳහා නව නිර්මාණ හා තාක්ෂණය පිළිබඳ මාර්ගෝපදේශණය | | |
| 3.1 | පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 100 | 19 |
| 3.2 | ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 50 | 05 |
| 3.3 | කෙටි කාලීන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් | 10 | 15 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (නවකයින් ) | 75 | 57 |
| 4 | නව නිර්මාණ සඳහා වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් | | |
| 4.1 | හස්තකර්මාන්ත නව නිර්මාණ ප්‍රදර්ශන | 01 | 01 |
| 4.2 | යොවුන් නිර්මාණකරුවන්ගේ ප්‍රදර්ශනය | 01 | 01 |
| 4.3 | පළාත් සභා අනුග්‍රහයෙන්/ විශේෂ අංගයන් යටතේ පවත්වනු ලබන ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය | 04 | 17 |
| 5 | තොරතුරු, අලෙවි අවස්ථා හා පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් | | |
| 5.1 | අමුද්‍රව්‍ය භාවිතා කිරීමේ තාක්ෂණය පිළිබඳ පර්යේෂණ | 02 | 01 |
| 5.2 | අලෙවි අවස්ථා සැපයීම | 30 | 12 |
| 5.3 | අලෙවි තොරතුරු සැපයිම | 60 | 95 |
| 5.4 | පුස්තකාල පහසුකම් සැපයීම | 310 | 261 |
| 6 | මෝස්තර උපදේශන සේවා | | |
| 6.1 | රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා මෝස්තර උපදේශක සේවාවන් සැපයීම | 15 | 05 |








## New Designs - Red Clay







## New Designs - Cane & Bamboo






# New Designs - Textile






# New Designs - Coir






## New Designs - jewellery








## New Designs - Brass







## New Designs - Lacquar








## New Designs - Leather








# New Designs - Wood








# New Designs - Rush & Reed












# Souvenirs




















# Young Designers Exhibition










# Consultancy Programms

# 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අවසාන ගිණුම්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

(සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය)

අංක 10, ද මැල් පාර, කටුබැද්ද, මොරටුව

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 01. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 24 |
| 02. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 25 |
| 03. මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 26 |
| 04. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 27 |
| 06. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් | 28 - 58 |

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2012 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 31.12.2012 | 31.12.2011 | 01.01.2011 |
|---|---|---|---|---|
| | | රු | රු | රු |
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපොළ පිරියත හා උපකරණ | 1 | 45,783,632.93 | 26,838,817.50 | 23,419,612.35 |
| වෙනත් මූල්‍ය වත්කම් | | 22,450.00 | 22,450.00 | 22,450.00 |
| | | 45,806,082.93 | 26,861,267.50 | 23,442,062.35 |
| වෙනත් අස්පෘශ්‍ය වත්කම් | 2 | 1,010,075.10 | 2,020,150.19 | 3,030,225.28 |
| ජංගම වත්කම් | | | | |
| අග තොගය | 3 | 2,748,174.13 | 2,708,480.61 | 2,157,613.81 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | 4 | 9,865,143.10 | 9,862,256.06 | 8,697,136.07 |
| පෙර ගෙවුම් | 5 | 276,925.29 | 178,938.12 | 84,379.41 |
| මුදල් හා සමාන දෑ | 6 | 5,878,107.81 | 3,958,673.13 | 8,730,229.42 |
| | | 18,768,350.33 | 16,708,347.92 | 19,669,358.71 |
| මුළු වත්කම් | | 65,584,508.36 | 45,589,765.61 | 46,141,646.34 |
| වගකීම් | | | | |
| ජංගම වගකීම් | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 7 | 3,040,793.94 | 4,469,605.07 | 4,906,683.25 |
| යූ එන ඩී පී උතුරු පළාත් වැඩමුලුවට ලැබූ අත්තිකාරම් | 8 | 4,391,905.76 | - | - |
| උපචිත වියදම් | 9 | 3,019,411.69 | 1,857,629.09 | 1,671,012.36 |
| ජංගම නොවන බැරකම් | | 10,452,111.39 | 6,327,234.16 | 6,577,695.61 |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 10 | 15,295,501.63 | 13,682,780.38 | 12,851,025.00 |
| මුළු වගකීම් | | 25,747,613.02 | 20,010,014.54 | 19,428,720.61 |
| මුළු ශුද්ධ වත්කම් | | **39,836,895.34** | **25,579,751.07** | **26,712,925.73** |
| ශුද්ධ වත්කම් රැස්කන්ධය | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 34,690,046.88 | 18,714,309.25 | 18,597,611.43 |
| අඩු කළා | | | | |
| ක්‍රමක්ෂය සඳහා සඳහා වෙන්කිරීම් පවත්නා වර්ෂය | 11 | 2,877,571.04 | 2,314,187.28 | 2,143,227.09 |
| අඩු කළා | | 31,812,475.84 | 16,400,121.97 | 16,454,384.34 |
| විලම්භිත අයභාර වියදම් | | 1,010,075.10 | 1,010,075.09 | 1,010,075.09 |
| | | 30,802,400.74 | 15,390,046.88 | 15,444,309.25 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 2,655,138.71 | 1,324,628.25 | 1,324,628.25 |
| සමුච්චිත අරමුදල | 12 | 6,379,355.89 | 8,865,075.94 | 9,868,437.03 |
| ජංගම ගිණුම් ශේෂ අතර වෙනස | | - | - | 75,550.95 |
| මුළු ශුද්ධ වත්කම් ස්කන්ධය | | **39,836,895.34** | **25,579,751.07** | **26,712,925.48** |

අධ්‍යක්ෂ
ජාතික මෝස්තර මධ්‍යස්ථානය

සභාපති
ජාතික මෝස්තර මධ්‍යස්ථානය

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය
## 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා විසිතීර්ණ ආදායම් ප්‍රකාශය

| | සටහන | 2012<br>රු | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|---|---|
| මෙහෙයුම් ආදායම් | | | | |
| භාණ්ඩාගාර ප්‍රදානපුනරාවර්තන | 13 | 36,358,000.00 | 36,621,000.00 | 34,915,000.00 |
| වෙනත් ආදායම් | 14 | 4,134,525.71 | 2,741,396.03 | 1,920,230.83 |
| | | 40,492,525.71 | 39,362,396.03 | 36,835,230.83 |
| <u>මෙහෙයුම් වියදම්</u> | | | | |
| සේවක පඩිනඩි | 15 | 27,888,563.83 | 25,691,326.04 | 25,371,032.74 |
| ගමන් වියදම් | 16 | 537,690.88 | 447,076.00 | 401,090.91 |
| සැපයුම් සේවා | 17 | 901,852.36 | 927,355.18 | 806,173.51 |
| නඩත්තු කටයුතු | 18 | 747,793.20 | 728,647.08 | 807,174.93 |
| ගිවිසුම්ගත සේවා | 19 | 9,204,494.62 | 9,158,321.41 | 5,098,417.05 |
| ක්ෂයවීම් | 20 | 2,890,136.56 | 2,322,364.58 | 2,417,170.16 |
| පාරිතෝෂිත | | 2,268,317.50 | 1,775,119.25 | 1,124,341.00 |
| වෙනත් වියදම් | 21 | 2,567,360.03 | 1,548,568.02 | 567,896.53 |
| | | 47,006,208.98 | 42,598,777.56 | 36,593,296.83 |
| මෙහෙයුම් කටයුතු වලින් අතිරික්තය | | (6,513,683.27) | (3,236,381.53) | 241,934.00 |
| <u>එකතු කළා</u> | | | | |
| විලම්භිත ආදායම් | | 2,877,571.04 | 2,314,187.28 | 2,143,227.09 |
| පවත්නා වර්ෂයේ අතිරික්තය | | (3,636,112.23) | (922,194.25) | 2,385,161.09 |
| <u>වෙනත් විස්තීර්ණ ආදායම්</u> | | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්ත | | | | |
| විදේශ විනිමය පරිවර්තනය කිරීමේ වෙනස | | | | |
| මූල්‍ය වත්කම් සාධාරණ අගයකට පරිවර්තනය කිරීමේ ලාභ | | | | |
| Acturial gains losses on defined benefit pension plans | | | | |
| මුලු විස්තීර්ණ ආදායම | | (3,636,112.23) | (922,194.25) | 2,385,161.09 |

වක්‍ර ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය
ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2012.12.31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2012 | | 2011 | | 2010 | |
|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය | | | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් අතිරික්තය රු හිගය | (6,513,683.27) | | (3,236,381.53) | | 241,934.00 | |
| (+) පෙර වර්ෂ සඳහා ගැලපීම් | 1,752,115.98 | | 206,931.48 | | 139,504.64 | |
| (-) පෙර වර්ෂ සඳහා ගැලපීම් | (601,723.81) | | (286,020.66) | | (126,575.00) | |
| මුදල් නොවන චලනයන් | | (5,363,291.10) | | (3,315,470.71) | | 254,863.64 |
| ක්ෂයවීම් | 2,890,136.56 | | 2,320,286.58 | | 2,417,170.16 | |
| පාරිතෝෂික | 2,268,317.50 | | 1,775,119.25 | | 1,124,341.00 | |
| අරමුදල් අතර ජංගම ගිණුම් අතර වෙනස | | | (75,550.95) | | | |
| අවසන් තොග (වැඩිවීම) / අඩුවීම | (39,693.52) | | (550,866.80) | | (273,015.13) | |
| අඩු / ( වැඩි) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | (2,887.04) | | (1,165,119.94) | | (1,024,402.29) | |
| පෙර ගෙවුම් අඩුවීම් /(වැඩිවීම්) | (97,987.17) | | (94,558.71) | | (24,372.93) | |
| :(අඩු) / වැඩි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | (1,428,811.13) | | (645,548.33) | | 456,267.38 | |
| ඍත්තිකාරම් ලැබීම් යථාර්ථීය වැඩසටහන | 4,391,905.76 | | | | | |
| පාරිතෝෂිත ගෙවීම් | (655,596.25) | | (943,363.80) | | (253,250.00) | |
| (අඩු) / වැඩි උපචිත වියදම් | 1,161,782.60 | 8,487,167.31 | 395,086.86 | 1,015,484.16 | (922,109.13) | 1,500,629.06 |
| මෙහෙයුම් කටයුතු වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය | | 3,123,876.21 - | | (2,299,986.55) - | | 1,755,492.70 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය | | | | | | |
| ගොඩනැගිලි | (204,485.09) | | (1,523,014.48) | | (83,240.25) | |
| යන්ත්‍ර උපකරණ | (441,046.72) | | (375,265.00) | | | |
| ඊ බඩ හා සවි කිරීම් | (833,852.30) | | (1,302,676.30) | | (15,330.00) | |
| කාර්යාල උපකරණ | (461,700.20) | | (285,370.00) | | (373,954.40) | |
| උපකරණ හා මෙවලම් | (58,325.00) | | (9,250.00) | | (4,640.00) | |
| පුස්ථකාල පොත් | (187,600.00) | | (409,805.96) | | (12,462.00) | |
| පරිගණක හා උපාංග | (1,801,058.00) | | (1,121,408.00) | | (980,374.00) | |
| වාහන | (366,374.22) | | (714,780.00) | | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය | | (4,354,441.53) | | (5,741,569.74) | | (1,470,000.65) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය | | | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන භාණ්ඩාගාරය | 3,150,000.00 | | 3,270,000.00 | | 5,500,000.00 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය | | 3,150,000.00 | | 3,270,000.00 | | 5,500,000.00 |
| මුදල් හා සමාන දෑ වැඩිවීම් /(අඩුවීම්) | | 1,919,434.68 | | (4,771,556.29) | | 5,785,492.05 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා සමාන දෑ | | 3,958,673.13 | | 8,730,229.42 | | 2,944,737.77 |
| වර්ෂය අවසානයේදී මුදල් හා සමාන දෑ | | 5,878,107.81 | | 3,958,673.13 | | 8,730,229.42 |

## 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන ප්‍රදාන රු | සමුච්චිත අරමුදල රු | ප්‍රත්‍යාගණන සංචිතය රු | මුලු මුදල රු |
|---|---|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 15,390,046.88 | 8,865,075.94 | 1,324,628.25 | 25,579,751.07 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වම් | | | | |
| මූලික දෝෂ | | 1,150,392.17 | | 1,150,392.17 |
| විලම්භිත අයභාර වියදම් කපා හැරීම | (1,010,075.10) | | | (1,010,075.10) |
| ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම | (2,877,571.04) | | | (2,877,571.04) |
| ප්‍රත්‍යාගණන සංචිත | | | 1,330,510.46 | 1,330,510.46 |
| භාණ්ඩාගාර ප්‍රදාන | 3,150,000.00 | | | 3,150,000.00 |
| මූල්‍ය කාර්යඵල ප්‍රකාශය | 16,150,000.00 | | | 16,150,000.00 |
| විදේශ මුදල් පරිවර්තන වෙනස | | | | - |
| කාලච්ඡේදයේ අතිරික්තය / හිගය | | (3,636,112.23) | | (3,636,112.23) |
| 2012.12.31 දිනට ශේෂය | 30,802,400.74 | 6,379,355.88 | 2,655,138.71 | 39,836,895.33 |

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2012 වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. ගිණුම්කරණ පදනම :
ඓතිහාසික පිරිවැය යටතේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ සම්මුතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ගිණුම්වලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් යොදා නොමැති අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

